(රාජ්‍ය/ අර්ධ රාජ්‍ය නිලධාරීන්/ බාහිර පුද්ගලයින් සඳහා)

අවසාන දිනය – **2026.08.03**

# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන පහත සඳහන් ව්‍යාපෘති වල පහත තනතුරු සඳහා රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පත්වීම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 විධිවිධානවලට යටත් වේ.

| **ව්‍යාපෘති වටිනාකම (ඇමරිකානු ඩොලර් මිලියන)** | **ව්‍යාපෘතියේ නම** | **තනතුරේ නම** | **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 ට අනුව සඳහන් කළ කාණ්ඩය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩයක් | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර I | ව්‍යාපෘති අධ්‍යක්ෂ | A | 01 |
| | | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | B | 01 |
| | | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | C | 02 |
| | | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී | E | 01 |
| | | ගිණුම් නිලධාරී | F | 01 |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර III | ප්‍රසම්පාදන විශේෂඥ | C | 01 |

**ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026, ඇමුණුම - 01 ට අනුව, ව්‍යාපෘති අධ්‍යක්ෂ (A කාණ්ඩය) (ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩය) තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) පහතින්]**

01.

- සාර්ථකව නිම කරන ලද අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

සහ

- අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) / ආශ්‍රිත සාමාජිකත්වයක් / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

02.

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ අධිසාමාජිකත්වය

සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026, ඇමුණුම - 01 ට අනුව, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (B කාණ්ඩය) (ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩය) තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]**

01.

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

සහ

- අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) / ආශ්‍රිත සාමාජිකත්වයක් / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

02.

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ අධිසාමාජිකත්වයක්

සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

03.

- රජයේ දීප ව්‍යාප්ත සේවාවක I වන පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක්.

සහ

- අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) /ආශ්‍රිත සාමාජිකත්වයක්/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

සමඟ

- I පන්තියේ තනතුරක හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්දක්

---

**සටහන -**

**• ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු සඳහා අදාළ ක්ෂේත්‍රය යනු "සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය" යන්න වන අතර අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ද තිබිය යුතුය.**

---

**<u>ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026, ඇමුණුම - 01 ට අනුව, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (C කාණ්ඩය) (ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩය) තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.</u>**

**<u>අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]</u>**

01.

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

සහ

- ආශ්‍රිත සාමාජිකත්වයක්/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක්

02.

- ආයතනික සාමාජිකත්වය/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක්

03.

- රජයේ දීප ව්‍යාප්ත සේවාවක I වන පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක්.

සහ

- ආශ්‍රිත සාමාජිකත්වයක්/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

සමඟ

- I පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක්

**<u>ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026, ඇමුණුම - 01 ට අනුව, ප්‍රසම්පාදන විශේෂඥ (C කාණ්ඩය) (ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩය) තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.</u>**

**<u>අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) පහතින්]</u>**

01.

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

  සහ

- අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) / ආශ්‍රිත සාමාජිකත්වයක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්.

  සමඟ

- කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක්.

02.

- රජයේ දීප ව්‍යාප්ත සේවාවක I වන පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්වයක්.

  සහ

- අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති) සුදුසුකමක්

  සමඟ

- I පන්තියේ තනතුරක හෝ ඒ හා සමාන තත්වයක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක්

**<u>ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026, ඇමුණුම - 01 ට අනුව, ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරී (E කාණ්ඩය) (ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩය) තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.</u>**

**<u>අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]</u>**

1.

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

  හෝ

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 04 ක පළපුරුද්ද.

2.

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 6 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 07 ක පළපුරුද්ද

3.

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්ද.

**ඉහත සඳහන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026, ඇමුණුම - 01 ට අනුව, ගිණුම් නිලධාරී (F කාණ්ඩය) (ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩය) තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [(1) හෝ (2) හෝ (3) පහතින්]**

1.

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්.

හෝ

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්ද.

2.

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 6 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 06 ක පළපුරුද්ද.

3.

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු, තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

- අවශ්‍ය වන විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 09 ක පළපුරුද්ද.

**සාමාන්‍ය කොන්දේසි :**

- බඳවා ගැනීම්, වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි, මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි දක්වා ඇති විධිවිධානවලට අනුකූල වේ.
- තෝරා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛ කොන්දේසි මත පදනම් වේ.
- සියලුම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව පුරවා අදාළ ලේඛනවල සියලුම පිටපත් යැවිය යුතුය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අපේක්ෂකයින් තෝරා ගනු ලැබුවහොත් ප්‍රදේශයේ සහ/හෝ රටේ ඕනෑම ස්ථානයක වැඩ කිරීමට එකඟ විය යුතුය.

**01.** **වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අවුරුදු 60 ට අඩු
- අනෙකුත් පුද්ගලයින් සඳහා අවුරුදු 64 ට අඩු

**02.** **වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 මත පදනම්ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03.** **රැකියාවේ කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරේ.

- අයදුම්කරු දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල ස්ථිර තනතුරක් දරන්නේ නම්, පත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයේ සඳහන් කර ඇති, නිත්‍ය තනතුරේ පත්කිරීමේ බලධාරියා විසින් නිර්දේශ කරන ලද නිදහස් කිරීමේ පදනම අනුව සහ සලකා බලනු ලබන නිවැරදි නිදහස් කිරීමේ පදනම මත පදනම් වේ.

- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නොමැති සහ අයදුම්පත සමඟ නිවැරදි දත්ත ඉදිරිපත් කර නොමැති අපේක්ෂකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති අපේක්ෂකයින් පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

- පත්වීම ලබා දීම හෝ ලබානොදීම සහ සේවය දීර්ඝ කිරීමේ තීරණය, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධානයන්ට අනුකූලව සිදු කෙරේ.

**04.** **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දැනටමත් දරන අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා හරහා සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් නිදහස් කිරීමේ කැමැත්ත සහ නිදහස් කිරීමේ පදනමේ නිර්දේශය ඇතිව එවිය යුතුය. (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**05.** **අයදුම්පත ඉදිරිපත් කිරීම**

පහත දක්වා ඇති ආකෘතියට අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යයන සුදුසුකම් පිළිබඳ විස්තර, මූලික උපාධියේ විස්තරාත්මක පිටපත, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, දැන්වීමේ දැක්වෙන තනතුරේ සහ ව්‍යාපෘතියේ නම එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිඛිතව සඳහන් කර, **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක: 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට 2026.08.03 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දීමෙන් අමාත්‍යාංශයේ පරිපාලන අංශය** වෙත ඉදිරිපත් කළ යුතුය.

**06.** **විශේෂ අවධානය සඳහා**

- **ලබාදී ඇති ආකෘතියට අනුකූලව නිසි ලෙස පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **අයදුම්පත සමඟ සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණක් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.**

**07. ඕනෑම විමසීමක් සඳහා කරුණාකර අමතන්න - 011-2271048**

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කර ඇති මෙම දැන්වීමෙහි භාෂා පාඨ අතර යම් නොගැලපීමක් තිබේ නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්වෙනු ඇත.**

A-F කාණ්ඩය සඳහා අයදුම්පත්‍ර ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**